www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාන පාලක පැලැන්තියේ කන්ඩායම් අතර ගැටුම් උග්‍ර අතට හැරේ

## Factional struggle deepens within Iranian ruling elite

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2009 ජූනි 19**

පරාජිත ජනාධිපති අපේක්ෂක මීර් හුසේන් මවුසාවිගේ ආධාරකරුවන් නව මැතිවරනයක් ඉල්ලා ගෙන යන උද්ඝෝෂන, ටෙහෙරාන් නගරයේ වීදිවල හයවන දිනටත් පැවැත්වෙද්දී, ඉරාන පූජක තන්ත්‍රයේ කන්ඩායම් අතර ගැටුම් වල ආතතිය ඉහල නැග තිබේ.

සඳුදා හටගත් ගැටුම් වලින් අඩුම ගනනේ පෙලපාලිකරුවන් හත් දෙනෙකු වත් මියගිය අතර, 18 දින විරෝධතාවන්හි දී ඔවුන් වෙනුවෙන් යාඥා කරන ලෙස මවුසාවි ඉල්ලා සිටියේ ය.

විරුද්ධ කඳවුරේ ප්‍රතිරූපය ප්‍රධානකොටම ඉහල මධ්‍යම පන්තීන් අතර මුල්බැස තීබීමේ කාරනය හමුවේ, එය දුරු කර ගැනීමේ උත්සාහයක් ලෙස රැලිය, බලයේ සිටින ජනාධිපති මහමුඩ් අහමඩිනිජාඩ් සැලකිය යුතු සහයෝගයක් දිනාගත්, වැඩිකොටම කම්කරු පන්තික ප්‍රදේශයක් වන අගනුවර දකුනේ පිහිටි ඉමාම් කොමෙයිනි චතුරස්‍රයේ දී පවත්වන ලදී. ඉරාන බලධාරීන් ''අනවසර'' පෙලපාලි වල වාර්තාකරනය තහනම් කිරීම ද ඇතුලු, විදේශ මාධ්‍යකරුවන් මත පනවා ඇති තහංචි හේතු කොට ගෙන පලවන වාර්තා සීමිත වී තිබේ.

අද දක්වා ම අහමඩිනිජාඩ්ට පිටුබලය දුන් ඉරානයේ අධ්‍යාත්මික නායක අයතොල්ලා අලි කමේනි, මවුසාවි හා ඔහුගේ ආධාරකරුවන් වෙත නැඹුරුවූ සම්මුතිවාදී පිලිවෙතකට යොමුවූ බවක් දක්නට ලැබේ. අහමඩිනිජාඩ්ගේ විරුද්ධවාදීන්ට එරෙහිව හැම අතින්ම මර්දනය දියත් කිරීමට ඔහු අවසර දී නැත.

අන්තර්ජාලය හා මාධ්‍ය මත සීමාවන් පනවා ඇති අතර, ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයට අනුව ප්‍රමුඛ මාධ්‍යවේදීන් හා ''ප්‍රතිසංස්කරනවාදීන්'' ද ඇතුලුව අඩුම තරමින් පුද්ගලයන් 170 රඳවා තබා ඇත. එහෙත් සෑම දිනකම පාහේ සැලකිය යුතු සීමා පැනවීම් වලින් තොරව, විරුද්ධ පක්ෂයේ විරෝධතා පැවැත්වීමට ඉඩ ලබාදී තිබේ.

15 වන සඳුදා මරන සිදුවූ බව පෙනී යන්නේ අහමඩිනිජාඩ් ට දැඩි සම්බන්ධකම් ඇති බසිජිස් නමැති අර්ධ සන්නද්ධ ස්වේච්ඡා හමුදාවේ ගොඩනැගිල්ලට විරෝධතා කරුවන් ගල් මුල් ප්‍රහාර එල්ල කිරීමෙන් අනතුරුව ඔවුන් සෙනඟ දෙසට වෙඩි තැබීමෙන් බවයි. ටෙහෙරාන් විශ්ව විද්‍යාලයේ සිසුන් ද වාර්තා කලේ බසිජි හමුදාවන් විසින් 14 දින රාත්‍රියේ සිය නේවාසිකාගාර වැටලූ අවස්ථාවේදී හටගත් ගැටුම් හේතුවෙන් සිසුන් පස් දෙනෙකු මියගිය බවයි. කමේනිගේ සමීපතමයෙකු ලෙස සැලකෙන ප්‍රබල පුද්ගලයෙකු වන පාර්ලිමේන්තුවේ කථානායක අලි ලරිජානි, ප්‍රහාරය ප්‍රසිද්ධයේ ම විවේචනයට ලක් කොට ඇත. ඔහු විරුද්ධ පක්ෂවලට එරෙහිව සිදුකල මර්දනය හා ප්‍රචන්ඩත්වය පිලිබඳව අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයට චෝදනා කලේය.

භාරකාර මන්ඩලය තුලින් ද කමේනි, මවුසාවි වෙත සම්මුතිවාදී පනිවිඩ නිකුත් කර තිබේ. ජනාධිපති මැතිවරනය අධීක්ෂනය කල ඡන්දයෙන් පත්කර නොගන්නා භාරකාර මන්ඩලය, සීමිත ලෙස වුවත් ඡන්ද පෙට්ටි ගනන් කිරීමට දැනටමත් එකඟත්වය පලකොට ඇත. ජනාධිපති අපේක්ෂකයන් තිදෙනා වන මවුසාවි, මේඩි කරෝබි හා මොෂීන් රෙසායි වෙතින් මැතිවරන මගඩි පිලබඳව පැමිනිලි 646 ක් ලැබී තිබෙන බවත්, අපේක්ෂකයින් සිව්දෙනා 20 දින හමුවීමට නියමිතව ඇති බවත්, එය 18 වන දින නිවේදනය කලේය.

ඊට පෙර දින ටෙහෙරානයේ පැවැත්වෙන යාඥාවල දී මූලිකත්වය ගැනීමට නියමිත කමේනි, ජාතික සමඟිය ගැන රූපවාහිනියෙන් විකාශනය කෙරෙන ඉල්ලීමක් කරන බව නිවේදනය කර ඇති අතර, එදින අවධානය යොමුවනු ඇත්තේ ඔහු වෙතය. ඊට සහභාගි වීමට බලාපොරොත්තුවෙන් සිටින මවුසාවි, තවදුර විරෝධතා 20 වන දින තෙක් කල් දමා ඇත. මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන්, ඉහල නගින විරැකියාව හා පිරිහෙන ජීවන තත්වයන් මුල්කොටගෙන, දැනට යටපත්ව ඇති කෝපය තුලින්

වඩා බලගතු සමාජ බලවේග මුදාහරිනු ඇතැයි පාලක පැලැන්තියේ සියලු කොටස් බියපත්ව සිටියි.

අහමඩිනිජාඩ් හා මවුසාවිගේ ආධාරකරුවන් අතර ඇත්තේ, ස්වභාවයෙන් උපායිකවූ වෙනස්කම් පමනි. හිටපු ජනාධිපති අලි අක්බාර් හෂෙමි රෆ්සන්ජානි විසින් නායකත්වය සපයන ඊනියා සම්ප්‍රදායික තත්කාර්යවාදීන්, එවැනි ම හිටපු ජනාධිපතිවරයෙකු වන මොහමඩ් කටාමි ද ඇතුලු විවිධ ''ප්‍රතිසංස්කරනවාදීන්'' සමඟ කල්ලි ගැසෙමින්, විදේශ හා ආර්ථික පිලිවෙත් වල මාරුවක් බලාපොරොත්තුවෙන් මවුසාවිට සහයෝගය දීම සඳහා පෙල ගැසී සිටිති.

ආර්ථික වශයෙන් ඉරානය තව දුරටත් හුදෙකලා වීමට හේතුවූ අහමඩිනිජාඩ්ගේ එක්සත් ජනපද විරෝධී කයිවාරු වැඩ පිලිවෙල, රෆ්සන්ජානි හා කටාමි යන දෙදෙනාගේ ම විවේචනයට ලක් විය. ඔබාමා බලයට පත්වීමත් සමඟ, ඉරාන පාලක පැලැන්තියේ කොටස් ඒ දෙස බැලුවේ, එක්සත් ජනපදය සමඟ ආරවුල් සමථයකට පත්කර ගැනීමේ හා නිදහස් වෙලඳපොල න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම හා රට විදේශ ආයෝජන සඳහා විවර කර ගැනීමේ මහඟු අවස්ථාවක් ලෙස ය. ඒවායේ උපායික ස්වභාවය තිබියදී ම එම මතභේද, ගෝලීය ආර්ථික පසුබෑම හා පහත වැටෙන තෙල් මිල ගනන් හේතු කොටගෙන ඉරානයට එල්ල වී ඇති බලපෑම් හමුවේ, උත්සන්න වී ඇත.

ඒකපාර්ශවික ජාත්‍යන්තර මාධ්‍ය ප්‍රචාරය මඟින් ලත් පිටුබලය සහිතව මවුසාවිගේ ආධාරකරුවෝ, අහමඩිනිජාඩ්ට සියයට 63 ක් ඡන්ද හිමිවූ මැතිවරන ප්‍රතිපලය ''දූෂිත'' එකක් ලෙස හඳුන්වති. එහෙත්, රටේ ජනගහනයෙන් අති මහත් බහුතරයක් නියෝජනය කරන ගම්බද හා නාගරික දුගීන් අතර අහමඩිනිජාඩ්ට සැලකිය යුතු සහයෝගිතා පදනමක් පැවති බව ප්‍රතික්ෂේප කරන්නේ නිරීක්ෂකයන් කිහිප දෙනෙක් පමනි.

දූෂිතයෙක් ලෙස පුලුල් ලෙස පිලිගැනෙන ප්‍රකෝටිපති රෆ්සන්ජානි ගෙන් ඔහුට ලැබෙන පිටුබලය ද, ඔහුගේ වෙලඳපොල ගැති පිලිවෙත් ද සහිතව, අහමඩිනිජාඩ්ගෙන් දුගීන් වෙත ලැබුනු සහන පිලිබඳව මවුසාවිගේ හෙලාදැකීම් මාධ්‍යගතකොට ඇත්තේ, බහුතරයක් වන වැඩ කරන ජනතාව අතර නොව, හොඳින් කල්ගෙවන නාගරික මධ්‍යම පන්තිය අතර ය.

දීර්ග හා කෙලින්ම ලබාගත් තොරතුරු මත පදනම් වූ ටයිම් වාර්තාකරු ජෝ ක්ලේන් සඳහන් කලේ, මැතිවරන දූෂන සිදුව තිබෙන අතරතුර වුවත්, සමහර විට දෙවැනි වටයේ ඡන්දයකට කොන්දේසි සකසන පරිදි ඡන්දයෙන් සියයට පනහකට අඩු ප්‍රමානයක් ලබාගනිමින් වූව ද, තියුනු ලෙස නමුත්, අහමඩිනිජාඩ් ජයග්‍රහනය කර තිබීම මුලුමනින්ම සිදුවිය හැකි දෙයකි. අනෙකුත් වාර්තාකරුවන් මෙන්ම ක්ලේන් ද ටෙහෙරානයේ පන්ති බෙදීම ගැන සඳහන් කරයි. මැතිවරන දිනයේදී අහමඩිනිජාඩ් ලමාවිය ගතකල ප්‍රදේශයේ සංචාරය කල ඔහු, ''මධ්‍යම පල්ලියෙහි රේබාවන් ද සෑම අතකින්ම උතුරු ටෙහෙරානයේ ගාම්භීර ඡන්ද මධ්‍යස්ථානවල මෙන්ම විය. මවුසාවිගේ ආධාරකරුවන් අතරින් පතර සිටි නමුත් අහමඩිනිජාඩ් අදහන්නවුන්ගෙන් නම් හිඟයක් නොවීය.''

මවුසාවි හා කරෝබි වැනි ප්‍රතිසංස්කරනවාදීන් ''පරාජිතයන්'' ලෙස හඳුන්වමින්, ඡන්දයට පෙරාතුව පැවති රූපවාහිනී විවාදවල දී සිය විරුද්ධවාදීන් අභිබවා අහමඩිනිජාඩ් හැම අතින්ම ජයගෙන තිබුනු බව ඔහු අවසානයට සඳහන් කලේය. ඔහු මෙසේ ලිවීය. ''ඔවුන් චකිතයට පත්කල ඔහුගේ ක්‍රියා පිලිවෙතෙහි සැඩ පරුෂ භාවය හමුවේ ඔවුහු කර කියාගත නොහැකි තැනකට ඇද වැටුනාහ. ඇමරිකානු තත්වයෙන් ගතහොත් මේවා, ජොෂ්ඨ ජෝර්ජ් බුෂ් හා නිව්ට් ගින්ග්‍රිච් අතර විවාදයක්, මහත්මා ගති සහිත ගතානුගතිකයෙකුට එරෙහි නොහික්මුනු ජනතාවාදී දබරයක් විය හැකිව තිබුනි.''

විවාදය අතරතුර අහමඩිනිජාඩ්, මවුසාවිගේ ආධාරකරුවන්වූ රෆ්සන්ජානි හා කටාමි දූෂිතයන් යයි ප්‍රසිද්ධියේ ම පහර ගැසීය. රෆ්සන්ජානි ප්‍රතිචාර දැක්වූයේ පෙර නොවූ විරූ තාලයේ ලිපියකින්, අහමඩිනිජාඩ් නියම මඟට ඇද නොදැමුවහොත් කෝපයේ ගිනිකන්දකට මුහුනපෑ යුතු බවට කමේනි වෙත අනතුරු අඟවමිනි.

බලයේ සුක්කානම සියතට ගැනීම සඳහා පාලක තන්ත්‍රය ඇතුලත කන්ඩායම් අතර දැන් සිදුවෙමින් ඇති අරගලය සමඟ, මවුසාවි පිටුපස සිදුවන පෙලගැසීමේ යථා ස්වභාවය මෙම සිදුවීමෙන් ප්‍රසිද්ධියේ ම එලිමහනට පැමිනියේ ය. දැඩි මතධාරී සම්ප්‍රදායික දෘෂ්ටීන් සහිත පුද්ගලයෙකු ලෙස පූර්වයෙන් ප්‍රසිද්ධියට පත්ව මවුසාවි, ලිබරල්වාදියෙකු ලෙස නඟා සිටුවමින් කටාමි වැනි ඊනියා ප්‍රතිසංස්කරනවාදීන්, ඔවුන්ගේ භූමිකාව රඟදක්වා ඇතත්, බල අරගලයේ ප්‍රධාන තැරැව්කරුවා වන්නේ රෆ්සන්ජානි ය. *ගාඩියන්* වාර්තාකරු සයිමන් ටිස්ඩෝල් මෙසේ සඳහන් කලේය. ''මෝරා හා නූල් සූත්තරකරු'' යන අන්වර්ත නාමයෙන් හඳුන්වන පුද්ගලයා, ''අහමඩිනිජාඩ් පෙරලා දැමීම සඳහා මවුසාවිගේ මැතිවරන ව්‍යාපාරය හැසිරවීම හා ඒ වෙනුවෙන් මුදල් වැය කිරීමේ දී, නොමසුරුව දායක විය.''

ප්‍රතිසංස්කරනවාදීන් හා සංස්තිතිකවාදීන් මවුසාවි පිටුපසින් එකම සන්ධානයකට ගෙන ඒම සඳහා රෆ්සන්ජානි වැඩ කල අතර ම, අහමඩිනිජාඩ්ගේ ඡන්ද පදනම බෙදා, මැතිවරනය දෙවන වටයට ඇද දැමීම සඳහා කරෝබි හා රෙසායී ට නාමයෝජනා ලබාගැනීමට ද ඔහු වැඩ කලේය. මවුසාවිගේ ආධාරකරුවන්ට මැතිවරන ව්‍යාපාරයේ කඳවුරු ලෙස ඔහු සතු පුද්ගලික විශ්වවිද්‍යාල වැලම යොදාගැනීමට ඔහු ඉඩ කඩ සලසා දුන්නේ ය. අෂාඩ් විශ්වවිද්‍යාලයේ සිට මැතිවරන කටයුතු නිරීක්ෂනය කිරීමේ සංකීර්න මෙහෙයුමක් දියත් කල ඔහුගේ පුත් මේඩි හෂෙමි රෆ්සන්ජානි, *නිව් යෝර්ක්* පුවත්පත සමඟ මෙසේ උදම් ඇනීය. ''මෙය අභ්‍යන්තර කටයුතු අමාත්‍යංශයට සමාන්තරය. එහෙත් අපගේ මෙහෙයුම රහසිගතය.''

පසුගිය සිකුරාදා ඡන්දයෙන් පසුව රෆ්සන්ජානි නිහඬව සිටියි. එහෙත් ඉස්ලාමීය ශාස්ත්‍රාලිකයන්ගේ ක්වෝම්හි දී ඔහු, පූජක සංස්ථාපිතය අතර සහයෝගය දිනාගැනීමේ නිරතවූ බව වාර්තා විය. උත්තරීතර නායක අලි කමේනි හික්මවීම හෝ තනතුරෙන් පහකිරීමේ ව්‍යවස්ථාපිත බලය පවා දරා සිටින එකම ආයතනය වන විශාරදයන්ගේ පර්ෂදයෙහි ප්‍රධානත්වය දරන්නේ රෆ්සන්ජානි ය. පෙර නොවූ විරූ එවන් පියවරක් මඟින් කිව නොහැකි තරම් ප්‍රතිවිපාක ගෙන ආ හැකි විවෘත දේශපාලන අරගලයක් මුදාහැරීම නොවැලැක්විය හැකි ය. කමේනි ම ඉලක්ක කිරීමට පටන්ගෙන ඇති විරුද්ධ පාර්ශවයේ සමහර සටන් පාඨ වලින් ඔහු, චිලියේ හිටපු ආඥාදායක ජෙනරාල් පිනෝෂේට සමාන කොට දක්වන්නේ යයි ද *ගාඩියන්* පත්‍රය වාර්තා කලේය.

කන්ඩායම් අතර තිරයට පිටුපසින් සිදුවන කටුක අරගලය පිලිබඳව ඇඟවුම් කෙරෙන සලකුනු බොහොමයකි. ප්‍රමුඛ විරුද්ධවාදී පූජකවරුන් බොහෝ දෙනෙක් ප්‍රසිද්ධියේම මැතිවරන ප්‍රතිපල විවේචනය කර තිබේ. බලපෑම් සහගත ප්‍රමුඛ අයතොල්ලා වරුන්ගේ කන්ඩායමක් වන සටන්කාමී පූජක සම්මේලනය ද පසුගිය සිකුරාදා, මැතිවරනය අයථාර්තවත් බව කියැවෙන ප්‍රකාශයක් නිකුත් කොට තිබේ. රජය සතු පුවත්පත් හා රූපවාහිනියට අනුව එම සංවිධානය, සෙනසුරාදා දිනයේදී ටෙහෙරානයේ වීදිවල විරෝධතා දැක්වීමට අවසර ඉල්ලා ඇත.

ඒ සමඟ ම අහමඩිනිජාඩ් හා ඔහුගේ ආධාරකරුවෝ ද වැඩට බැසගෙන සිටිති. 290 කින් සමන්විත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් 220 දෙනෙක් අහමඩිනිජාඩ්ගේ පත්වීම අනුමත කරමින් ඔහු වෙත ලිපියක් යවා ඇත. විශේෂයෙන්ම ඔහුගේ අයවැය හා ආර්ථික ප්‍රතිපත්ති මුල් කොට ගෙන පාර්ලිමේන්තුවේ දී තියුනු විරුද්ධත්වයකට මුහුනපා සිටි අහමඩිනිජාඩ් වෙත පලවූ ඉහල ප්‍රතිචාරය වැදගත් ය. මැතිවරනයට මඳකට පෙරාතුව, ඉන්ධන, විදුලි බලය හා ජලය මත ආන්ඩුව ගෙවන සහනාධාර කපාහැරීමේ යෝජනා, සමස්ත රාජ්‍ය වියදම් කෙරෙහි සීමා පැනවීම් අන්තර්ගත නොකිරීමේ කාරනය මුල් කොට ගෙන, පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කලේය.

කන්ඩායම් අතර මෙම උත්සන්න අරගලය මධ්‍යයේ දෙපාර්ශවය ම, වැඩ කරන ජනතාව හා තරුනයන් සිය ප්‍රජාතන්ත්‍රීය අයිතින් හා යහපත් ජීවන තත්වයන් ගැන නඟන හඬ ගසාකමින් සිටියි. නිදහස පිලිබඳ සිය පුහු පොරොන්දු තිබියදී ම මවුසාවි ඔහුගේ විරුද්ධවාදීන්ට වඩා ''ප්‍රජාතන්ත්‍රවාදයට'' කැපවූ අයෙක් නොවේ. බහුතරයක් වන වැඩ කරන ජනතාව මත අලුතින් දැවැන්ත බර පැටවීමට පමනක් තුඩුදෙනු ඇති ඔහුගේ නිදහස් වෙලඳපොල න්‍යාය පත්‍රය, විරුද්ධත්වය පැන නොනංවා ක්‍රියාවට නැඟීම කල නොහැකි වනු ඇත. 1980 ගනන් වල අගමැතිව සිටිය දී සිදුකල ආකාරයට ම මවුසාවි, සිය පිලිවෙත් බලගැන්වීම සඳහා රාජ්‍යයේ මුලු ශක්තිය යොදාගැනීමෙහි ලා පසුබට නොවනු ඇත.

මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා දුප්පත්කම ද විරැකියාව ද නිමා කල හැකි අඛන්ඩ අරගලයක් ගෙනයාමෙහි සමත් එකම සමාජ බලවේගය වන්නේ කම්කරු පන්තියයි. අත්‍යාවශ්‍ය කර්තව්‍ය වන්නේ, ඉරාන ධනේශ්වරයේ සියලු කොටස් වලින් ස්වාධීනව, නාගරික හා ගම්බද දුගීන් ද සමඟ එක්ව කම්කරුවන් මෙහෙයවීම සඳහා විප්ලවවාදී පක්ෂයක් ගොඩනැඟීමයි. එවන් ව්‍යාපාරයක් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා ද ජාත්‍යන්තරව හා මැද පෙරදිග පුරා සමාජවාදය සඳහා අරගලයේ නොවෙන්කලහැකි කොටසක් ලෙස සමාජවාදී ඉරානයක් සඳහා ද සටන් වැදිය යුතු ය. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ඉදිරිපත් කරන ඉදිරිදර්ශනය එයයි.

© www.wsws.org